# ශ්‍රී ලංකාවේ 20වන සියවසේ දේශපාලන සන්දර්භය තුළ ඥාති සම්බන්ධතාවයක් නොමැතිව දේශපාලනයට සම්බන්ධ වූ කාන්තාවන් සිටීද යන්න පිළිබඳ විමර්ශනයක්

ඒ.ජී.සී. ලක්මාලි

මානව ශාස්ත්‍ර අධ්‍යයනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
chandimaarukgoda@gmail.com

**මුඛ්‍ය පද -** කාන්තාව, දේශපාලනය, ඥාති සබඳතා, ශ්‍රී ලංකාව, නියෝජනය

## හැඳින්වීම

ලාංකේය දේශපාලනය තුළ කාන්තාවට ඉඩක් හිමි නොවූයෙන් 1931 ඩොනමෝර් ආණ්ඩුක්‍රමය හරහා කාන්තාවන්ට එම අවස්ථාව හිමි විය. මෙලෙස 20වන සියවසේ ලාංකේය දේශපාලනයට කාන්තා නියෝජිතයන් ලෙස පළමුව හා දෙවනුව පත් වූයේ ඇඩලීන් මොලමුරේ හා නේසම් සරවනමුත්තු ය. මෙලෙස ලාංකේය දේශපාලනයට කාන්තාවගේ ආගමනය සිදු විය. මෙහි දී මෙම පර්යේෂණයේ අරමුණ වූයේ ලාංකේය දේශපාලනයට කාන්තාවගේ ආගමනය සිදු වන්නේ ඥාතීත්වය මත පදනම්ව ද නොමැතිව ද යන්න අධ්‍යයනය කිරීමයි. එහි දී ලාංකේය දේශපාලනයට පැමිණි කාන්තාවන් අතර ඥාතීත්වය මත පදනම් නොවී එක් කාන්තාවක් හෝ දේශපාලනයට පිවිස ඇති ද යන්න මෙහි පර්යේෂණ ගැටලුවයි.

## ක්‍රමවේදය

මෙකී පර්යේෂණ ගැටලුව සාධනය කර ගැනීම සඳහා සාහිත්‍යමය මූලාශ්‍ර අධ්‍යනයක් සිදු කර ඇත. එහි දී මූලිකවම සාහිත්‍යමය මූලාශ්‍ර පරිශීලනය කරන ලදි.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

ලාංකේය දේශපාලනය තුළ මුල් කාලීනව බලයට පත් වූ කාන්තාවන් වූ ඇඩලීන් මොලමුරේ යනු රුවන්වැල්ල ආසනය සඳහා එවකට තේරී පත් වී සිටි ජේ.එම්. මීදෙනිය අධිකාරම්ගේ දියණිය යි. ඔහුගේ හදිසි අභාවය හේතු කොටගෙන ඒ සඳහා පවත්වනු ලැබූ අතුරු මැතිවරණයේ දී ඇය ජය ගත්හ. ඇය ප්‍රධාන ප්‍රතිවාදී අපේක්ෂකයා වූ ආර්.ඇස්.ඇස්. ගුණවර්ධනට එරෙහිව වැඩි ඡන්ද 9000 ලබා ගනිමින් අතිවිශිෂ්ට ජයග්‍රහණයක් සනිටුහන් කරනු ලැබුවේ පියාගේ මෙන්ම ප්‍රථම රාජ්‍ය මන්ත්‍රණ සභාවේ ප්‍රථම කතානායකවරයා ලෙස පත් වූ ඇයගේ සැමියා ඒ.එෆ්. මොලමුරේ මහතාගේ නායකත්වය හා පෞර්ෂත්වය ද මතය. ඉන් අනතුරුව දේශපාලනයට පිවිසි දෙවන කාන්තාව ලෙස හඳුනා ගනු ලබන්නේ නේසම් සරවනමුත්තු මහත්මියයි. ඇය තේරී පත් වූයේ සැමියාගේ දේශපාලන සහායිකාව වශයෙනි. 1931 දී උතුරු කොළඹ ආසනය දිනා ගත් දොස්තර රත්නජෝති සරවනමුත්තුගෙන් පසු 1932 මැයි 28 වන දා පැවැත් වූ අතුරු මැතිවරණයෙන් ඇය ජයග්‍රහණය කළේය. එලෙස තේරී පත්වන නේසම් සරවනමුත්තු 1941 දී අභාවයට යන තෙක්ම සෞඛ්‍යය පිළිබඳ විධායක කාරක සභාවේ සභාපතිනිය ලෙස කටයුතු කරනු ලැබුවේ ඥාතීත්වය මත ලැබූ දේශපාලන පදනම මතය.

ඉන් අනතුරුව 1948 දී පිලිප් ගුණවර්ධන මහතාගෙන් පසු අවිස්සාවේල්ල ආසනයට කුසුමා ගුණවර්ධන මහත්මිය නිතරගයෙන් පත් විය. එමෙන් ම මහනුවර ආසනය අහිමි වූ ටී.බී. ඉලංගරත්න මහතා වෙනුවෙන් අතුරු මැතිවරණයට තරඟ කළ කුමාරි ඉලංගරත්න මැතිණිය ජයග්‍රහණය කර පාර්ලිමේන්තුවට පිවිසියේ ය. 1952 දී පැවැත් වූ මැතිවරණයට එස්. ඒ වික්‍රමසිංහගේ බිරිඳ ඩෝරින් වික්‍රමසිංහ තවත් කාන්තාවන් සමඟ තරඟ කර ජය ගත්හ.

1956 මැතිවරණයේ දී මීරිගම ආසනයට තරඟ කර ජය ගත් විමලා සිරිවර්ධන ශ්‍රී ලංකාවේ ප්‍රථම සෞඛ්‍යය ඇමතිවරිය වූවාය. ඇය ද ඥාතීත්වය මත පදනම් වූ දේශපාලනමය පසුබිමක්

සහිත ධනවත් පැලැන්තියේ කාන්තාවකි. ඇයගේ බෑනා වූ සී.ආර්. බෙලිගම්මන මේ වන විට දේශපාලනයට පිවිස සිටියේය.

තෙවන පාර්ලිමේන්තු වාරය තුළ ලෙස්ලි ගුණවර්ධනගේ බිරිඳ වූ විවියන් ගුණවර්ධන ඔහුට සමකාලීනව දේශපාලනයට පිවිස පාර්ලිමේන්තුව නියෝජනය කළ අතර ඇය පිලිප් ගුණවර්ධනගේ ද ඥාති දියණියකි. 1956 මැතිවරණයෙන් වැලිමඩ ආසනයට තේරී පත් වූ කේ.එම්.පී රාජපක්ෂ මහතාගේ අසුන පසුව අතුරු මැතිවරණයකින් අනතුරුව ඔහුගේ බිරිඳ වූ කුසුමා රාජරත්න ට හිමි විය.

1956 දී අගමැති බණ්ඩාරනායක ඝාතනයෙන් පසු සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය පත් කළ මන්ත්‍රීවරියක ලෙස දේශපාලනයට පිවිසියේ ය. ඉන් ඇරඹි ගමන තුළ ඇය 1965 මැතිවරණයෙන් ලංකාවේ මෙන් ම ලෝකයේ ප්‍රථම අගමැතිනිය බවට පත් විය. අනතුරුව ඇය දෙවන වරට ද අගමැතිනිය ලෙස පත් විය. 1947 සිට 1977 දක්වා කාලවකවානුව තුළ අවස්ථාවන් 78ක දී තරඟ කළ අතර ඉන් අවස්ථා 25 දී ම ජයගෙන ඇත. 1994 දී චන්ද්‍රිකා බණ්ඩාරනායක ලංකාවේ දෙවන අගමැතිනිය ලෙස තේරී පත් විය. ඇය ලෝකයේ ම අගමැතිවරුන් දෙදෙනෙකුගේ දියණියක ලෙස අගමැතිනිය බවට පත් වූ එකම කාන්තාව ලෙස ගෞරවාදරයට පත් විය. ඇයට පෙර හා පසුව කාන්තාවන් විශාල වශයෙන් දේශපාලනයට පිවිසීම දැක ගත හැක.

එලෙස දේශපාලනයට පිවිසි කාන්තාවන් අතර සුනේත්‍රා රණසිංහ, අමරා පියසීලි රත්නායක, සුජාතා ධර්මවර්ධන වැනි කාන්තාවන් ද විය. ඔවුන් දේශපාලනයට පිවිසියේ ඥාති සම්බන්ධතා මතය. සුමිත්‍රා ප්‍රියංගනී අබේධීර දේශපාලනයට පිවිසෙන්නේ පියා ඉන්ද්‍රපාල අබේධීර ගේ අභාවයෙන් පසුවය. හේමා රත්නායකගේ සැමියා වූ පු.බ. රත්නායකගෙන් පසුව ද ශ්‍රීමනී ඇතුලත්මුදලිගේ සැමියා ලලිත් ඇතුලත් මුදලිගෙන් පසුව ද, නිරූපමා රාජපක්ෂ සිය පියා වූ ජෝර්ජ් රාජපක්ෂගේ දේශපාලන මඟ පෙන්වීම මත ද, පවිත්‍රා වන්නිආරච්චි පියා ධර්මදාස වන්නිආරච්චිගේ දේශපාලන උරුමය මත ද 20වන සියවස තුළ දේශපාලනයට පිවිසි කාන්තාවන් අතර විය.

1977 දී නුවරඑළිය ආසනයෙන් තරඟ කළ රේණුකා හේරත් මහත්මිය පාර්ලිමේන්තුවට පිවිසි කාන්තාවක් ලෙස හඳුනා ගැනේ. විදුහල්පතිවරයෙකුගේ දියණියක වූ ඇය ගුරුවරියක ලෙස කටයුතු කර ඇත. ඇය දේශපාලනයට ස්වකීය උත්සාහය මත පක්ෂ සංවිධායකවරියකු ලෙස පිවිසීය. ඇයගේ දේශපාලන ගමන් මඟ ඥාති සම්බන්ධතා මත පදනම් වූ එකක් නොවීය. ලාංකේය දේශපාලනයට බොහෝ කාන්තාවන්ගේ ආගමනය සිදු වූයේ ඥාතීත්වය මත පදනම්ව ය. මෙකී විග්‍රහය තුළ පැහැදිලිව ම අවබෝධ වන කාරණාවක් වන්නේ මුල් කාලීන කාන්තා නියෝජනය සකස් වී ඇත්තේ ඥාති සම්බන්ධතා මතින් බවයි. මෙම විග්‍රහයෙන් 99% ක් තරම් වූ විශාල ප්‍රමාණයක් දේශපාලනයට පිවිසෙන්නේ ඥාතීත්වය පාදක කොටගෙන ය. නමුත් 1997 දී මධ්‍යම පාන්තික පවුල් පසුබිමක් සහිතව ස්වකීය උත්සාහය මත දේශපාලනයට පිවිසෙන්නේ රේණුකා හේරත් මහත්මිය පමණි. 20වන සියවස තුළ හමුවන කාන්තා නියෝජනයන්හි ආරම්භයේ සිට ඥාතීත්වය මත පදනම් වූ දේශපාලන අඩිපාරේ යාමක් දැකගත හැක. ඒ තුළ මුල් කාලීනව ලංකාවේ කාන්තා නියෝජිතයන් කාන්තා අයිතිය වෙනුවෙන් අරගල කළ කාන්තාවන්ගෙන් නියෝජනයක් නොවීම දැක ගත හැකි වූ විශේෂ කරුණක් විය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

පල්ලියගුරුගේ, රවීන්ද්‍ර චන්ද්‍රසිරි.(2014), ***වනිතා දේශපාලනය.*** ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

***ශ්‍රී ලාංකික දේශපාලනය තුළ කාන්තා සහභාගීත්වය,*** 1998, සංස්කාරක විනීෆ්‍රඩ් ප්‍රනාන්දු, ප්‍රඩ්‍රික්ඒබට් පදනම.